# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ: බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
දිනය: 2022.12.30


## “කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්” ආයතනය - මහජන වගකීම් නැවත ගෙවීම

'ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්ම' යටතේ බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස, “කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්” ආයතනය මුහුණ දුන් අඛණ්ඩ ප්‍රාග්ධන ඌනතා තත්ත්වය හේතුකොට ගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 25 (1) (ක) වගන්තිය ප්‍රකාරව, කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ සියළුම මහජන වගකීම් (තැන්පතු සහ පොරොන්දු නෝට්ටු) 2022.12.26 සිට 2023.02.28 දක්වා කාලසීමාව තුළදී සම්පූර්ණයෙන්ම නැවත ගෙවීමට කටයුතු කරන ලෙසට එම ආයතනය වෙත නියෝග කිරීමට තීරණය කරන ලදී.

“කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්” ආයතනයේ සියළුම මහජන වගකීම් සම්පූර්ණයෙන් නැවත ගෙවීමට අවශ්‍ය අරමුදල් සම්පාදනයට අවශ්‍ය පියවර තහවුරු කිරීමෙන් සහ එම මහජන වගකීම් ගෙවීමෙන් පසු එම ආයතනය වෙත මුදල් ව්‍යාපාර කටයුතුවලින් ඉවත් වන ලෙසට නියෝග කිරීමෙන් අනතුරුව, “කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්” ආයතනයේ තැන්පතුකරුවන්ගේ සහ පොරොන්දු නෝට්ටුහිමියන්ගේ යහපත උදෙසා ඉහත කී නියෝගය නිකුත් කර ඇත.

ඒ අනුව, කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය විසින් එකග වී ඇති පොළී අනුපාතයන්ට අනුව 2022.12.26 දින දක්වා උපචිත වන පොළී මුදල්ද ඇතුළුව සම්පූර්ණ මහජන වගකීම් ප්‍රමාණය ගෙවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

මෙම නැවත ගෙවීමේ සැලැස්මට අනුව 2023.02.28 දිනට පෙර සිය මුදල් නැවත ලබාගන්නා ලෙස “කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්” ආයතනයේ සියළු තැන්පතුකරුවන් සහ පොරොන්දු නෝට්ටුහිමියන් වෙත දැනුම් දී සිටිමු.

වැඩිදුර විමසීම් සඳහා:

| ආයතනය | අරමුණ | දුරකථන අංක | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව- බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව | පොදු විමසීම් සඳහා | 011 2477504 | snbfi_query@cbsl.lk |
| “කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්” ආයතනය | තැන්පතු/ පොරොන්දු නෝට්ටු නැවත ලබාගැනීම සම්බන්ධයෙන් විමසීම් සඳහා | 0114 381 381 | info@kanrich.lk |